／

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1889/40 – 2014 නොවැම්බර් 21 වැනි සිකුරාදා – 2014.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 345 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2014/E/302.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MTR/LND/ACQUI/L02/3928.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මාතර.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත්සතර සුළු කොට්ඨාසයේ රස්සන්දෙණිය, වැල්ලමඩම ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක MR/MTR/2014/475 හා 2014.10.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.7972 ක් පමණ වූ පහත නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නුගගහවත්ත පැගිරිවත්ත – ප්‍රමාණය: හෙක්. 2.7972**

උතුරට: ප්‍රගමන අනුරේඛන අංක MR/MTR/2014/264 හි කැබලි අක්ෂර ඒ, තක්සලා උයන සහ කලපුව; නැගෙනහිරට: කලපුව; දකුණට: කලපුව සහ ඒදන්ඩ ඇළ; බටහිරට: ඒදන්ඩ ඇළ, මාර්ගය, මුපි මාර 2198 හි කැබලි අංක 2 සහ ප්‍රගමන අනුරේඛන අංක MR/MTR/2014/264 හි කැබලි අක්ෂර ඒ.

12 – 220



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1996 නොවැම්බර් මස 09 වැනි දින අංක 948/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1996 අංක 269 හා 1996.11.01 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/96/AS/94.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: දො/ඉ/1/අත්/10.
2014 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුව සුළු කොට්ඨාසයේ, වෙල්ලත ගමේ පිහිටි, කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක Ka/DDN/96/253 හා 1996.10.18 වැනි දින දරන පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1925ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර 'ඒ' – ක්ලෝඩන් වතුයාය – ප්‍රමාණය: **හෙක්. 0.1925ක් පමණ**

උතුරට: ගම්සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඩී. එම්. ගුණසේකර හිමිකම් කියන ක්ලෝඩන් කුඹුර; දකුණට: ඩී. එම්. ගුණසේකර හිමිකම් කියන ක්ලෝඩන් කුඹුර සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ ගම්සභා මාර්ගය.

12 - 221

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1996 නොවැම්බර් මස 19 වැනි දින අංක 950/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1996 අංක 287 හා 1996.11.14 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/96/AS/1/367.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: දො/ඉ/1/අත්/08.
2014 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ සුළු කොට්ඨාසයේ, උදුපිටිගොඩ ගමේ පිහිටි, කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක KA/DDN/96/252 හා 1996.10.29 වැනි දින දරන පුගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.404ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අංක 1 – ක්ලයිඩ් වතුයාය ගල්කැටිය කොටස – ප්‍රමාණය: **හෙක්. 0.404ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ක්ලයිඩ් වතුයායේ ගල්කැටිය කොටසේ ඉතිරි කොටස; දකුණට: ඇළ; බටහිරට: ඇළ සහ ගම්සභා මාර්ගය.

12 - 222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.